**29-09-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පියා ඔබට ඥානයේ තෙවැනි ඇස ලබා දීමට පැමිණ සිටියි, එය තුළින් ඔබ ලෝකයේ මුල, මැද සහ අග පිළිබඳව දැනුවත් වෙයි.

**ප්‍රශ්නය:** සිංහදේනුවන් හෙවත් ශක්තීන්ට පමණක් එඩිතරව විස්තර කළ හැක්කේ කුමන කරුණද?

**පිළිතුර:** පියා මෙසේ පවසන බව, වෙනත් ආගම් වල අයට, ඔය ශක්තීන් විස්තර කළ යුතුයි : තමන් උත්තරීතර පියා නොව, ජීවාත්මයක් බව සලකන්න. තමන් ජීවාත්මයක් බව සලකා, පියාව සිහිපත් කරන විට, ඔබගේ පාපයන් දුරුවී ගොස්, ඔබ විමුක්ති දේශයට යයි. ඔබ පරම ජීවාත්මය බව සැලකීමෙන් ඔබගේ පාපයන් දුරු වන්නේ නැත. මෙම කාරණාව විස්තර කිරීමට හැකි වන්නේ බොහෝ නිර්භීතකමක් ඇති ඔය ශක්තීන්, සිංහදේනුවන්හට පමණයි. මෙය විස්තර කිරීමට ඔබ පුහුණු විය යුතුයි.

**ගීතය:** අන්ධයින්ට පාර පෙන්වනු මැනවි, ප්‍රිය දෙවියනි!

ඕම් ශාන්ති. ඇතැම් දරුවන් අපහසුතා අත්විඳින අතර, ආධ්‍යාත්මික වන්දනා ගමනේ සිටීමේද අපහසුතා තිබෙන බව පෙනී ගොස් ඇත. භක්ති මාර්ගයේ ඔවුන් දොරින් දොරට ඉබාගාතේ යයි. ඔවුන් බොහෝ විවිධ මාදිලියේ තපස් රැකීම, යාග හෝම පැවැත්වීම, ආගමික ග්‍රන්ථ කියවීම ආදිය කරති. මේ නිසයි එයට බ්‍රහ්මාගේ රාත්‍රිය යැයි කියන්නේ. චක්‍රයෙන් භාගයක් එය රාත්‍රිය වන අතර චක්‍රයේ ඉතිරි භාගයේ එය දහවලය. බ්‍රහ්මා තනිව නොසිටියි, එහෙම නේද? ඔහු ප්‍රජාපිතා බ්‍රහ්මා (ප්‍රජාවගේ පියා) බැවින්, ඔහුගේ දරුවන්, කුමර කුමරියන්ද නිසැකයෙන්ම සිටිනු ඇත. කෙසේවෙතත්, මිනිසුන්ට මෙය වැටහෙන්නේ නැත. ලෝකයේ මුල, මැද සහ අවසානය පිළිබඳ ඥානය ලැබෙන තෙවැනි ඇස පිළිබඳ ඥානය, ඔබට ලබා දෙන්නේ පියා පමණයි. පෙර චක්‍රයේද ඔබ බ්‍රහ්මණයින් වී ඉන්පසුව දේවතාවන් බවට පත් වූවා. මෙය බවට පත් වූ අය, නැවතත් එයම බවට පත් වෙයි. ඔබ අයත් වන්නේ ආදි සනාතන දෙවි දේවතා ධර්මයටයි. වැඳුම් ලබන්නට සුදුසු වන්නේ ඔබ පමණයි, ඉන්පසුව ඔබ වඳින්නන් බවට පත් වෙයි. ඉංග්‍රීසියෙන් ඔවුන්ට 'වැඳුම් ලබන්නට සුදුසු' සහ 'වඳින්නන්'කියා කියයි. චක්‍රයෙන් භාගයක් වඳින්නෙක් වන්නේ භාරතයයි. තමන් වැඳුම් ලබන්නට සුදුස්සෙක්ව සිට ඉන්පසුව වඳින්නෙක් වූ බව, ජීවාත්ම පිළිගනී. වැඳුම් ලබන්නට සුදුස්සන්ව සිට ඔබ වඳින්නන් බවට පත් වී ඉන්පසුව ඔබ නැවතත් වැඳුම් ලබන්නට සුදුස්සන් බවට පත් වෙයි. පියා වැඳුම් ලබන්නට සුදුස්සෙක් හෝ වඳින්නෙක් වන්නේ නැත. ඔබ දේවතාවන්ව සිටි කළ, ඔබ පිවිතුරුව සිටි බවත් වැඳුම් ලබන්නට සුදුසුව සිටි බවත් ඔබ පවසයි. ඉන්පසුව උපත් 84 කට පසුව, ඔබ සම්පූර්ණයෙන්ම අපවිත්‍ර වඳින්නන් බවට පත් වූවා. ආදී සනාතන දෙවි දේවතා ධර්මයට අයත්ව සිටි භාරතයේ ජනතාව, මෙකල තමන්ගේම ධර්මය ගැන කිසිම දෙයක් නොදනී. ඔබ කතා කරන දේවල් ගැන, අන් සියලුම ආගම් වල අයට වැටහෙන්නේ නැත. මෙම ධර්මයෙන් වෙනත් ආගම් වලට හැරී ඇති අයයි නැවත වරක් පැමිණෙන්නේ. බොහෝ දෙනෙක්ව හරවාගෙන ඇත. පියා පවසන්නේ ශිවා සහ දේවතාවන්ව වන්දනා කරන අයට, මෙය ඉතා පහසුයි. අන් සියලුම ආගම් වල අය, ඔබගේ ඔළුව කා දමයි (බොහෝ ප්‍රශ්න අසයි) ! අන් ආගම් වලට හැරී ඇති අයට, මෙම දේවල් වලින් බලපෑමක් ඇති වී, ඔවුන් පැමිණ වටහාගැනීමට උත්සාහ දරනු ඇත. එසේ නොමැති නම් ඔවුන් එය විශ්වාස නොකරනු ඇත. ආර්ය සමාජයෙන් බොහෝ දෙනෙක් පැමිණ ඇත. සීක් සමාජයෙන් ඇතැම් අයද මෙහි පැමිණ ඇත. ආදී සනාතන දෙවි දේවතා ධර්මයෙන් වෙනත් ආගම් වලට හැරී ඇති අය අනිවාර්යෙන්ම නැවතත් ඔවුන්ගේම ආගමට පැමිණෙයි. ගසෙහි පිංතූරයේ වෙන් වෙන් කොටස් පෙන්වා තිබේ. ඔවුන් සෑම කෙනෙක්ම අංක පිළිවෙලට නැවතත් පැමිණෙයි. අතු, රිකිලි අඛණ්ඩව මතු වෙයි. එම ජීවාත්ම පිවිතුරු බැවින් ඔවුන් ඉතා හොඳ බලපෑමක් ඇති කරයි. මෙකල, දේවතා ධර්මයේ අත්තිවාරම නොපවතින බැවින්, එය නැවතත් ඇති කළ යුතු වනවා. ඔබ ඔවුන්ව සහෝදර සහෝදරියන් බවට පත් කළ යුතුයි. අප සැවොම ජීවාත්ම, සහෝදරයන්, එක පියාගේ දරුවන්ය. ඉන්පසුව අපි සහෝදරයන් සහ සහෝදරියන් බවට පත් වනවා. දැන් නව ලෝකය ස්ථාපිත කෙරෙන බැවින්, පළමුවෙන්ම බ්‍රහ්මණයන් සිටිනවා. නව ලෝකය ස්ථාපනය කිරීමට අනිවාර්යෙන්ම ප්‍රජාපිතා බ්‍රහ්මා අවශ්‍ය වනවා. බ්‍රහ්මණයින් නිර්මාණය වන්නේ බ්‍රහ්මා මාර්ගයෙනි. මෙයට රුද්‍රාගේ ඥාන යාග ගින්න යැයිද කියයි. මේ සඳහා අනිවාර්යෙන්ම බ්‍රහ්මණයන් අවශ්‍යයි. ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන් අනිවාර්යෙන්ම අවශ්‍යයි. ඔහු මී මුත්තාය.

බ්‍රහ්මණයින් පළමු අංකයයි, මුදුන් මල්කඩයි. මිනිසුන් ආදම් සහ බීබි හෝ ආදම් සහ ඒව ගැන විශ්වාස කරති. මෙකල වඳින්නන්ගෙන් වැඳුම් ලබන්නට සුදුසු අය බවට ඔබ පත් වෙමින් සිටිනවා. ඔබ සියලු දෙනාගේ හොඳම සිහිවටනය වන්නේ දිල්වාලා දේවාලයයි. ඔබ බිම තපස්යාවේ අසුන් ගෙන සිටින ආකාරය මෙන්ම උඩ සිවිලිමේ රාජධානියද පෙන්වා ඇත ඔබ මෙහි ජීවමාන ස්වරූපයෙන් අසුන් ගෙන සිටිනවා. එම සියලුම දේවාල විනාශ වීමට යන අතර ඉන්පසුව නැවත වරක් භක්ති මාර්ගයේදී ඒවා නිර්මාණය වෙයි. අප දැන් රාජයෝගාව ඉගෙන ගන්නා අතර අපි ඉන්පසුව නව ලෝකයට යන බව ඔබ දන්නවා. එය අජීව දේවාලය වන අතර ඔබ මෙහි ජීවමානව අසුන් ගෙන සිටිනවා. ප්‍රධාන දේවාලය නිවැරදිව නිර්මාණය කර තිබේ. ඔවුන් සිවිලිමේ දිව්‍යලෝකය පෙන්වා ඇත. දිව්‍යලෝකය වෙන කොහේ පෙන්වන්නද? ඔබට මෙම මාතෘකාව ඉතා හොඳින් විස්තර කළ හැක. ඔවුන්ට කියන්න දිව්‍යලෝකය වූයේ භාරතය පමණක්ම වන අතර එය දැන් අපාය වී තිබේ. මෙම ධර්මයේ අය මෙය විගසින් වටහා ගනීවි. බොහෝ හින්දූන්ද වෙනත් ආගම් වලට ගොස් ඇත. ඔවුන්ව නැවත ගෙන ඒමට ඔබ බොහෝ උත්සාහ දැරිය යුතුයි. බාබා විස්තර කර තිබෙන්නේ තමන් ජීවාත්මයක් බව සලකා, නිරන්තරයෙන් මා පමණක් සිහිපත් කරන්න! එපමණයි! වෙනත් කිසිම දෙයක් ගැන කතා කරන්න එපා! මෙම පුහුණුව නොමැති අය, කිසිවක්ම නොකිව යුතුයි. එසේ නොමැති නම් ඔවුන් බ්‍රහ්මකුමාරීන්ගේ නමට අපහාස කරනු ඇත. වෙනත් ආගම් වලින් පැමිණි අය සිටින්නේ නම්, ඔවුන්ට විස්තර කරන්න, ඔබට විමුක්ති දේශයට යාමට අවශ්‍ය නම්, තමන් ජීවාත්මයක් බව සලකා, පියාව සිහිපත් කරන්න. තමන් පරම ජීවය බව සලකන්න එපා. තමන් ජීවාත්මයක් බව සලකා, පියාව සිහිපත් කිරීමෙන් ඔබගේ බොහෝ උපත් වල පාපයන් කැපී ගොස් ඔබ විමුක්ති දේශයට යනු ඇත. 'මන්මනභව' යන මෙම මන්ත්‍රය ඔබට ඇති. කෙසේවෙතත්, කතා කිරීමට ඔබට එඩිතරකම අවශ්‍යයි. ශක්තීන්, සිංහදේනුවන්ට පමණයි මෙම සේවය කළ හැකි වන්නේ. සන්‍යාසීන් පිටරට ගොස් විදේශිකයන්ට මෙහි පැමිණීමට ආරාධනා කරන්නේ මෙසේ කියමින් එන්න, මා ඔබට ආධ්‍යාත්මික දැනුම ලබා දෙන්නම්. ඔවුන් පියාව හඳුනන්නේවත් නැහැ. ඔවුන් බ්‍රහ්ම පදාර්ථය දෙවියන් බව සලකා, සෑම කෙනෙකුටම එය සිහි කරන්නට කියා කියයි. කුරුල්ලෙක් කූඩුවකට දමන්නා සේ, ඔවුන් නිකම්ම මෙම මන්ත්‍රය ලබා දෙයි. මේ අන්දමින් විස්තර කිරීමට කල් ගත වෙයි. බාබා ඔබට කියා තිබෙන්නේ 'ශිව දෙවියන් කතා කරයි' කියා සෑම පිංතූරයකම සඳහන් විය යුතුයි. ඔහුගේ ස්වාමියා සහ අධිපතියා නොමැතිව සෑම කෙනෙක්ම අනාථයෙක් බව ඔබ දන්නවා. මිනිසුන් කන්නලව් කරන්නේ මවත් ඔබයි, පියාත් ඔබයි කියා. හොඳයි, මින් අදහස් වන්නේ කුමක්ද? ඔවුන් නිකම්ම දිගින් දිගටම කියන්නේ 'ඔබගේ අනුකම්පාව තුළින් අපට බොහෝ සතුට තිබේ' කියා. පරම පියා දැන් ඔබට දිව්‍යලෝකයේ සතුට වෙනුවෙන් උගන්වන අතර ඔබ දැන් ඒ සඳහා උත්සාහ දරනවා. යමක් කරන කෙනෙකුට එහි ඵලය ලැබෙයි. මෙකල සෑම කෙනෙක්ම අපවිත්‍රයි. පාරිශුද්ධ ලෝකය, නව ලෝකය, වන්නේ දිව්‍යලෝකය පමණයි. මෙහි, කිසිම කෙනෙකුට සතෝප්‍රධාන් විය නොහැක. ස්වර්ණමය යුගයේ සතෝප්‍රධාන්ව සිටි අය, තමෝප්‍රධාන් සහ අපවිත්‍ර වී ඇත. ක්‍රිස්තුස්වහන්සේට පසුව පැමිණෙන, ක්‍රිස්තියානි ආගමේ සියලු දෙනාම මුලදී සතෝප්‍රධාන් වනු ඇත, එසේ නොවේද? ඔවුන්ගෙන් සිය දහස් ගණන් සිටින විට, ඔවුන්ගේ හමුදාව සටන් කර ඔවුන්ගේ රාජධානිය හිමි කරගැනීමට සූදානම්ය. ඔවුන් සතුට මෙන්ම දුකද අඩුවෙන් අත්විඳියි. ඔබට තිබෙන සතුට වෙනත් කිසිම කෙනෙකුට අත්විඳිය නොහැක. ඔබව දැන් සතුටු දේශයට යාමට සූදානම් කරවමින් සිටිනවා. වෙනත් ආගම් වල කිසිම කෙනෙක් දිව්‍යලෝකයට නොයයි. එය දිව්‍යලෝකයව පැවති කල්හී මෙන්, වෙනත් කිසිම දේශයකට, භාරතය තරම් පිවිතුරු විය නොහැක. පියා පැමිණි විට පමණයි, දෙවියන්ගේ රාජධානිය ස්ථාපනය කරන්නේ. එහි කිසිම යුද්ධයක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. සටන් කිරීම සහ යුද්ධ කිරීම ආරම්භ වන්නේ ඉන් බොහෝ කලකට පසුවයි. භාරතයේ ජනයා වෙනත් අය තරම් සටන් කර නොමැත. ඔවුන් එකිනෙකා අතර ටිකක් සටන් කර, බෙදුණාය. තඹ යුගයේදී ඔවුන් එකිනෙකාට පහර දෙයි. මෙම පිංතූර ආදිය නිර්මාණය කිරීමට බොහෝ නුවණ අවශ්‍යයි. ඔබ මෙසේද ලිවිය යුතුයි පෙර දිව්‍යලෝකයව පැවති භාරතය, දැන් අපාය වී ඇති අන්දම ගැන, පැමිණ වටහාගන්න. භාරතයට විමුක්තිය තිබුණු අතර එය දැන් පහත් අඩියක තිබේ. එය තුළින් ඔබට විමුක්තිය ලැබෙන, ඥානය ලබා දිය හැක්කේ පරම පියාට පමණයි. මනුෂ්‍යයින්ට මෙම ආධ්‍යාත්මික ඥානය නොමැත. පරම පියා, පරමාත්ම ජීවයට පමණයි මෙම ඥානය තිබෙන්නේ. මෙම ඥානය ඔය ජීවාත්මයන්ට ලබා දෙන්නේ පරම පියා පමණයි. වෙනත් සෑම තැනකම මනුෂ්‍යයින් වෙනත් මනුෂ්‍යයින්ට දැනුම දෙයි. ආගමික ග්‍රන්ථ මනුෂ්‍යයින් විසින් ලියා ඇති අතර ඒවා හදාරන්නේද මනුෂ්‍යයින්ය. මෙහි, ආධ්‍යාත්මික පියා ඔබට උගන්වන අතර ඉගෙන ගන්නේ ඔය ජීවාත්මයි. ඉගෙනගන්නේ ජීවාත්මයන්ය. එහි, ලියන්නේ සහ ඉගෙනගන්නේ මනුෂ්‍යයින්ය. පරම පියාට කිසිම ආගමික ග්‍රන්ථයක් ආදිය හැදෑරීමට අවශ්‍ය නැත. පරම පියා පවසන්නේ එම ග්‍රන්ථ ආදිය ඉගෙනගැනීමෙන් කිසිම

කෙනෙකුට විමුක්තිය ලබා ගත නොහැක. මා පමණක්ම පැමිණ සියලු දෙනාවම ආපසු නිවහනට රැගෙන යා යුතුයි. දැන් ලෝකයේ මනුෂ්‍යයන් බිලියන ගණනක් සිටියි. ස්වර්ණමය යුගයේ එය ලක්ෂ්මී සහ නාරායන්ගේ රාජධානිය සමයේ ජීවාත්ම 900,000 ක් සිටියේය. එය ඉතාමත්ම කුඩා වෘක්ෂයකි. අනිත් සියලුම ජීවාත්ම ගියේ කොහාටද කියා ටිකක් සිතා බලන්න. ඔවුන් බ්‍රහම් පදාර්ථයට හෝ ජලයට මුසු වූයේ නැත. ඔවුන් සියලුම දෙනා විමුක්ති දේශයේ ඉතිරි විය. සෑම ජීවාත්මයක්ම අවිනාශී වන අතර කිසිදා මැකිය නොහැකි අවිනාශී චරිත කොටසක් එය තුළ තැටි ගත වී තිබේ. ජීවාත්මයක් කිසිම විටෙක විනාශ කළ නොහැක. ජීවාත්මයක් කුඩා තිතක් පමණයි. තවමත් කිසිම කෙනෙකුට නිර්වාණ දේශය ආදියට යාමට නොහැක. සෑම කෙනෙක්ම තමන්ගේ චරිත කොටස රඟපෑ යුතුයි. සියලුම ජීවාත්ම පහළට පැමිණි පසු, මා එවිට පැමිණ සියලුම ජීවාත්ම ආපසු රැගෙන යන්නෙමි. පියාගේ චරිත කොටස ඇත්තේ අවසානයේදීය. නව ලෝකයේ ස්ථාපනය ඇති අතර ඉන්පසුව පැරණි ලෝකයේ විනාශය සිදුවෙයි. මෙයත් නාටකයේ නියම වී තිබේ. ඔබ ආර්ය සාමාජිකයන් කණ්ඩායමකට විස්තර කරන විට, දේවතා ධර්මයට අයත්ව සිටි කෙනෙක් සිටින්නේ නම්, මෙම ඥානය ඔහුව ස්පර්ෂ කරනු ඇත. ඔබ කියන දේ සැබවින්ම නිවැරදි බව ඔහුට වැටහෙයි. පරමාත්ම දෙවියන් සර්ව ව්‍යාප්ත වන්නේ කෙසේද? පරමාත්ම දෙවියන්, පියා වන අතර, අපගේ උරුමය අපට හිමි වන්නේ ඔහුගෙනි. ආර්ය සමාජයෙන් ඔබ වෙතට පැමිණෙන ඕනෑම කෙනෙකුට අංකුරයක් යැයි කියනු ලබයි. දිගින් දිගටම ඔවුන්ට විස්තර කරන්න, එවිට ඔබගේ වංශයට අයත් අය ඔබ වෙතට පැමිණෙයි. දෙවි පියාණන් ඔබට පිවිතුරු වීමට ක්‍රම කියා දෙයි. පරමාත්ම දෙවියන් කතා කරයි නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න! පාරිශුද්ධකරු වන්නේ මමයි. මා සිහි කිරීමෙන් ඔබගේ පාපයන් දුරු වී ඔබ විමුක්ති දේශයට යනු ඇත. මෙම පණිඩ්ඩය සියලුම ආගම් වල අයටයි. ඔවුන්ට කියන්න සියලුම ශාරීරික ආගම් අත්හැර මා සිහි කරන්න, එවිට ඔබ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වෙයි. ගුජරාටි කෙනෙක් හෝ මේ-මේ කෙනා වීමේ අවධානය අත්හරින්න. තමන් ජීවාත්මයක් බව සලකා පියාව සිහිපත් කරන්න. මෙය යෝගාවේ ගින්නයි. ඔබ ගන්නා සෑම පියවරක්ම ප්‍රවේසමෙන් ගත යුතුයි. සෑම කෙනෙක්ම මෙය වටහාගන්නේ නැත. පරම පියා පවසන්නේ පාරිශුද්ධකරු වන්නේ මා පමණයි. ඔබ සෑම කෙනෙක්ම අපවිත්‍රයි. පළමුව පිවිතුරු නොවී, කිසිම කෙනෙකුට නිර්වාණ දේශයට යාමට නොහැක. ඔබ නිර්මාණයේ මුල, මැද සහ අවසානයද වටහාගත යුතුයි. මෙය සම්පූර්ණයෙන්ම වටහා ගැනීමෙන් පමණයි, ඔබට උසස් තත්ත්වයක් හිමි වන්නේ. අඩුවෙන් භක්තියේ යෙදී ඇති අය, මෙම ඥානය වටහාගන්නේ ඉතාම අඩුවෙනි. බොහෝ භක්තියේ යෙදී ඇති අය, මෙම ඥානය බොහෝ සේ අරගනී. පියා ඔබට විස්තර කරන සෑම දෙයක්ම ඔබ ධාරණය කළ යුතුයි. විශ්‍රාමික තත්ත්වයේ සිටින අයට මෙය වඩාත් පහසුයි. ඔවුන් ගෘහස්ථ සම්බන්ධතා වලින් ඉවත් වී ඇත. විශ්‍රාමික වයස පැමිණෙන්නේ වයස අවු 60 න් පසුව පමණයි එවිටයි ඔවුන් ගුරු කෙනෙක් වෙතට යන්නේ. දැන් කාලයේ ළදරුවන්ටත් ගුරු කෙනෙක් සොයා දෙනු ලබයි. එසේ නැත්නම් පළමුව පියාද, ඉන්පසුව ගුරුවරයාද, පසුව වයස අවු 60 න් පසුව පමණයි ගුරු කෙනෙක් වෙතට යන්නේ. විමුක්තිය පිරිනමන්නා වන්නේ ඒකායන පියා පමණයි. ඒ එකදු ගුරු කෙනෙකුටවත් විමුක්තිය පිරිනැමිය නොහැක. ඒ සියල්ලම ඔවුන්ට මුදල් උපයා ගැනීමේ මාර්ගයි. සියල්ලන්ටම විමුක්තිය ලබා දෙන සත්ගුරු වන්නේ එක් අය පමණමයි. පරම පියා පවසන්නේ මම ඔබට සියලුම වේද සහ ග්‍රන්ථ වල සාරය විස්තර කරන්නෙමි. ඒ සියල්ලම භක්ති මාර්ගයේ ව්‍යාප්තියයි. සෑම කෙනෙක්ම ඉනිමඟ දිගේ පහළට පැමිණිය යුතුයි. මෙසේ කියයි ඥානය, භක්තිය සහ ඉන්පසුව භක්තිය ගැන නිරාශාවක් තිබේ. ඔබට ඥානය ලැබෙන විටයි, ඔබට භක්තිය ගැන නිරාශාවක් ඇතිවන්නේ. ඔබට මෙම පැරණි ලෝකය ගැන නිරාශාවක් තිබේ. ඔබ ලෝකය අත්හලේ නම්, ඔබ වෙන කොහේ යන්නද? මෙම ලෝකය විනාශ වීමට යන බව ඔබ දන්නවා. මේ නිසයි අසීමිත ලෝකය අත්හැරිය යුත්තේ. පළමුව පිවිතුරු නොවී, ඔබට ආපසු නිවහනට යාමට නොහැක. පිවිතුරු වීම සඳහා, සිහිපත් කිරීමේ වන්දනා ගමන අවශ්‍යයි. භාරතයේ ලේ ගංඟාවන් තිබුණාට පසුවයි, එහි කිරි ගංඟාවන් තිබෙන්නේ. විෂ්ණුව පෙන්වා ඇත්තේ කිරි විලක සැතපෙන අන්දමින්ය. විමුක්තියේ සහ ජීවන-මුක්තියේ දොරටු විවර වන්නේ මෙම යුද්ධය තුළින් බව විස්තර කර දී තිබේ. ඔය දරුවන් වැඩියෙන් දියුණුවත්ම, මෙම හඬ දිගින් දිගටම මතු වනු ඇත. යුද්ධය දැන් සිදුවීමට ඉතාමත්ම ආසන්නයි. පෙර, එක් පුළිඟුවකින් සිදුවූයේ කුමක්ද කියා බලන්න! ඔවුන් අනිවාර්යෙන්ම සටන් කරන බව ඔවුන් විශ්වාස කරයි. යුද්ධ නිරන්තරයෙන් පැවතෙයි. ඔවුන් එකිනෙකාගේ උදව්කරුවන් වෙයි. ඔබටත් නව ලෝකයක් අවශ්‍යයි. එබැවින්, මෙම පැරණි ලෝකය අනිවාර්යෙන්ම විනාශ විය යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මෙම පැරණි ලෝකය දැන් විනාශ වීමටයි තිබෙන්නේ. එබැවින්, මෙම පැරණි ලෝකය අත්හරින්න! ඔබ ලෝකය අතහැර කොහේවත් යා යුතු නැහැ, නමුත් ඔබගේ බුද්ධියෙන් එය අමතක කළ යුතුයි.
2. නිර්වාණ දේශයට යාමට සම්පූර්ණයෙන්ම පිවිතුරු වන්න. නිර්මාණයේ මුල, මැද සහ අවසානය ගැන සම්පූර්ණයෙන්ම වටහාගෙන, නව ලෝකයේ උසස් තත්ත්වයක් හිමි කරගන්න.

**වරදානය:** ඔබ නිවැරදි සේවාධාරියෙකු වී ජීවාත්මයන්ට ලැබීම් අත්විඳීමට හැකියාව ලබා දෙත්වා.
සත්‍ය සේවය කිරීමේ අවධානය තිබීම යනු සෑම ජීවාත්මයක් වෙනුවෙන්ම යහපත් හා උසස් ප්‍රාර්ථනා ඇති කෙනෙකුගේ අවධානය නිරන්තරයෙන් තිබීමයි. සේවය කිරීමේ අවධානය යනු සෑම ජීවාත්මයකටම ඔවුන්ගේ හැඟීම් වලට අනුව ඵල අත්විඳීමට හැකියාව ලබා දීමයි. සේවය කිරීම යනු ජීවාත්මයන්ට යම් ලැබීමක ඵලයක් අත්විඳීමට සැලැස්වීමයි. එවැනි සේවයක තපස්යාව ගැලී පවතී. තපස්යාවේ අභිප්‍රාය සැබෑ සේවය කිරීමේ අභිප්‍රායෙන් වෙන් නොවේ. අත්හැරීම සහ තපස්යාව නොමැති ඕනෑම සේවාවක් නමට පමණක් කරන සේවාවකි. එබැවින්, අත්හැරීමේ, තපස්යාවේ සහ සේවයේ ඒකාබද්ධ ස්වරූපය තුළින්, සත්‍ය සහ නිවැරදි සේවාධාරියෙකු බවට පත්වන්න.

**පාඨය:** නිහතමානීකමේ සහ ඉවසීමේ ගුණාංග උකහා ගන්න, එවිට ඔබ ඕනෑම කෝපයේ ගින්නක් සිසිල් කරනු ඇත.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සෙනෙහස් ගින්න දල්වා, ඔබගේ යෝගාව ගිණි කන්දක් මෙන් කරගන්න.**

දැන් නිර්භීත හා ගිනිකන්දක් බවට පත් වී පදාර්ථයේ සහ ජීවාත්මයන්ගේ තමෝගුණී ගති ස්වභාවයන් පුළුස්සා දමන්න. තපසයා යනු ගිණිකඳු ස්වරූපයේ ස්මරණයයි. මායාගේ සහ පදාර්ථයේ බියකරු ස්වරූපය සිසිල් වන්නේ ඔබේ ස්මරණය තිබීමෙන් පමණි. ඔබේ තුන්වන ඇස, ඔබේ ගිණිකඳු ඇස, මායා බල රහිත කරවයි.